**ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (අයිඅයිඩීපී) - 2013**

**------------------------------------------------------------**

ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ (අයිඅයිඩීපී) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2012 ජනවාරි 30 දින එළඹි අංක 1-857 දරන මූල්‍යයන ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**---------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. උතුරු පළාතේ පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව හා උතුරු පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වාරිමාර්ග යටිතල පිළිබඳ ඵලදායී හා තිරසාර කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සහ ජලය හා ඉඩම් ඵලදායිතාවය පිළිබඳ තිරසාර සංවර්ධනය ඉටුකර ගැනීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 29.32 ක් වන අතර ඉන් එජඩො මිලියන 22.23 ක් මූල්‍යයනය කිරීම සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් එකඟවී තිබුණි. එජඩො මිලියන 3.16 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කළ යුතුය. තවද එජඩො මිලියන 2.70 ක් සඳහා ප්‍රතිලාභීන් විසින් දායක වීම අපේක්ෂා කරන අතර තවත් එජඩො මිලියන 1.23 ක් පුද්ගලික අංශය විසින් මූල්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජනවාරි 30 දින ආරම්භ කරන ලද අතර 2017 මාර්තු 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 ව්‍යාපෘති සංරචකයන්

**----------------------**

ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ සංරචක සාරාංශ කර පහත දැක්වේ.

සංරචක 1 :- යටිතල සංවර්ධනය
- (අ) වාරිමාර්ග යටිතල පුනරුත්ථාපනය
- (ආ) වෙනත් යටිතල සංවර්ධනය

සංරචක 2 :- නිෂ්පාදනය හා අලෙවිකරණය
- (අ) සමාජ සවලීකරණය හා පුහුණුව
- (ආ) නිෂ්පාදන ව්‍යාප්ත කිරීම හා අලෙවිකරණය
- (ඇ) වෙනත් කෘෂිකර්ම සංවර්ධනය

සංරචක 3 :- ව්‍යාපෘති කළමනාකරණය

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණ පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව, 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව. සහ

(ඍ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර,මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණ පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

**----------------------**

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.335,244,373 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | 2013 වර්ෂය සඳහා වියදම | 2012 වර්ෂය සඳහා වියදම | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 316,819,478 | - | 316,819,478 |
| මෝටර් වාහන , ලී බඩු හා උපකරණ | 4,602,840 | - | 4,602,840 |
| උපදේශක සේවා සහ අධ්‍යයන | 1,563,491 | - | 1,563,491 |
| පුහුණු | 785,231 | - | 785,231 |

| | | | |
|---|---|---|---|
| වැටුප් හා දීමනා | 9,401,086 | 2,497,385 | 11,898,471 |
| මෙහෙයුම් හා කළමනාකරණ පිරිවැය | 2,072,247 | 467, 277 | 2,539,524 |
| | ---------------- | -------------- | --------------- |
| එකතුව | 335,244,373 | 2,964,662 | 338,209,035 |

**4.2 අග්‍රිම අරමුදල් ගිණුම**

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය පහත දැක්වේ.

| | රු. |
|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | නැත. |
| ලැබුණු ප්‍රතිපූර්ණයන් | 424,112,960 |
| අඩු කළා - ආපසු ගැනීම් | 335,244,373 |
| විදේශ විනිමය පාඩුව | 316,110 |
| | ----------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 88,552,477 |
| | ========== |

**5. විගණන නිරීක්ෂණ**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

ව්‍යාපෘතිය විසින් සපයන ලද අරමුදල්වලින් කොන්ත්‍රාත්කරුවකු විසින් මිලදී ගෙන තිබූ රු.942,204 ක් වටිනා ලී බඩු හා උපකරණ ලී බඩු හා උපකරණ යටතේ දක්වනු වෙනුවට සිවිල් වැඩ පිරිවැය යටතේ සාවද්‍යාව දක්වා තිබුණි.

**5.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2006 සැප්තැම්බර් 22 දිනැති අංක ඕඑම්එස් 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් මුදා හරින ලද ව්‍යාපෘති නිලධාරීන්ට රු.846,000 ක් වූ දිරි දීමනා ගෙවා තිබුණි.

**6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**6.1 අරමුදල් උපයෝජනය**

ලබා ගත හැකි වූ තොරතුරු අනුව මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සැපයීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| කෘසංජාඅ | 22.23 | 2,890.0 | 350.0 | 300.3 | 2.31 | 300.3 |
| ශ්‍රී ලං ර | 3.16 | 410.0 | 125.0 | 34.94 | 0.31 | 37.9 |
| ප්‍රතිලාභී දායකය | 2.70 | 351.0 | - | - | - | - |
| පුද්ගලික අංශ සහභාගීත්වය | 1.23 | 159.9 | - | - | - | - |
| එකතුව | 29.32 | 3,810.9 | 475.0 | 335.24 | 2.62 | 338.2 |

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, 2013 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවල රු.මිලියන 475 ක මුදලක් වෙන්කර තිබුණු අතර ඉන් රු. මිලියන 335 ක් පමණක් උපයෝජනය කර තිබුණි. වර්ෂය සඳහා සංරචක අනුව කරන ලද වෙන්කිරීම් සහ එහි උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සංරචකය | 2013 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල | 2013 වර්ෂයේ උපයෝජනය කරන ලද මුදල | උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | |
| යටිතල සංවර්ධනය | 422 | 317.85 | 24.68 |
| නිෂ්පාදනය හා අලෙවිකරණය | 13 | 0.72 | 94.46 |
| ව්‍යාපෘති කළමනාකරණ පිරිවැය | 40 | 16.67 | 58.33 |
| | 475 | 335.24 | 29.42 |

(ආ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගැනීම සඳහා සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි වගකීම් දක්වමින් මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂිකව මූල්‍ය හා භෞතික ඉලක්ක ඇතුළත් කර පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ ආරම්භක මූල්‍යායන සැලැස්ම අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් වෙනුවෙන් උපදේශක සේවා සඳහා රු.19,230,000 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වුවද, සිවිල් වැඩ සඳහා උපදේශකවරයෙකු 2013 දෙසැම්බර් 31 වන විටත් පත්කර නොතිබුණි.

## 6.2 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) කිලිනොච්චි ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාලය සඳහා රු.942,204 ක් වටිනා කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය කිරීමට සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි. තවද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා රු.242, 834 ක පිරිවැයකට මිලදී ගනු ලැබූ විධායක පුටු 02 ක් නියැදි පදනම මත සිදු කරන ලද භෞතික සත්‍යාපනයේදී විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඊට අමතරව, රු.3,251,904 ක් වටිනා අමතර වැඩ විෂයයන් 37 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකක ගොඩනැගිල්ලේ අළුත්වැඩියා යටතේ සිදු කිරීමට ඉඩ දී තිබුණු අතර විධිමත් අනුමැතියක් නොමැතිව ඒ සඳහා ගෙවීම් කර තිබුණි.

(ආ) තවද පරන්තන්හි වාරිමාර්ග ඇල පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව යටතේ රු.8,595,595 ක් වටිනා අමතර වැඩ විෂයයන් 55 ක් විධිමත් අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා රු.830,380 ක මුදලක් ගෙවා තිබුණද වාරිමාර්ග පද්ධතියේ අළුතෙන් පිරවූ ඉවුරු වල පිඩලි වැඩ ( turf works) සිදුකර නොතිබූ බව විගණන පරීක්ෂණයේදී අනාවරණය විය.

(ඇ) ආර් බී ප්‍රධාන වැනලය (RB Main Channel ) (පැකේජ - 06 ) පුනරුත්ථාපනය කිරීම යටතේ රු.28,990,661 ක් වටිනා අතුරු ගෙවීම්, නිම කරන ලද වැඩ පිළිබඳ මැනීම් සිදු කිරීමෙන් තොරව ව්‍යාපෘති ඉංජිනේරුවන් විසින් සහතික කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එබැවින් ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීම පිළිබඳ සාක්ෂි අසතුටුදායක විය .

## 6.3 පරිබාහිර ස්වභාවයේ විෂයයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාරිමාර්ග නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයේ එකතුව රු.651,481 ක් වූ විදුලි වියදම් හා වාහන අළුත්වැඩියා වියදම් ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා වෙන්කරන ලද මුදල්වලින් ගෙවා තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ සමාජ සවලීකරණ කාර්යයන් සඳහා රාජ්‍ය නොවන සංවිධාන කුලියට ලබා ගැනීමට ව්‍යාපෘතිය විසින් රු.72,912 ක් වූ දැන්වීම් ගාස්තු දරා තිබුණි. කෙසේ වුවද රාජ්‍ය නොවන සංවිධානයක් තෝරා ගැනීම හෝ සමාජ සවලීකරණය පිළිබඳ කාර්යයන් ආරම්භ කිරීම 2013 දෙසැම්බර් 31 වන විටත් සිදුකර නොතිබුණි.